# 03 කාලසටහන පුරවමු



දූලා පුතාලා

මේ සටහන දිහා හොඳට බලන්න.

මේ මොකක් ද?

කාලසටහනක් ටීචර් ....

අන්න හරි. අද අපි කාලසටහන

සිංහලෙන් සම්පූර්ණ කරන්නයි යන්නේ.

ඔයාලා විෂයන් කීයක් ඉගෙන ගන්නවා ද?

දහයයි ටීචර්.

| කාලච්ඡේදය | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| වි වේ ක කා ල ය | | | | | |
| 05 | | | | | |
| 06 | | | | | |
| 07 | | | | | |
| 08 | | | | | |

හොඳයි, ශංකර් කියන්න ....

දවසකට කාලච්ඡේද කීයක් තියෙනවා ද?

අටයි ටීචර්.

බොහොම හොඳයි...

රජීව් කියන්න සතියේ පාසල් දවස් පිළිවෙළ.

**සඳුදා, අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා**

හොඳයි, හරියට ම හරි.

හැමෝම ලොකු අත්පොඩියක් ගහන්න.

ආ ... එහෙනම් දැන් ශිවානි කියන්න

සතියේ නිවාඩු දවස් දෙක.

**සෙනසුරාදා, ඉරිදා.**

බොහොම හොඳයි

සාරධා **විවේක කාලය** තියෙන්නේ වේලාව කීයට ද?

උදේ 10.30ට ටීචර්

හරියට ම හරි

රමේෂ් කියන්න, ඔයාලා ඉගෙන ගන්නා

ප්‍රධාන විෂයන් මොනවා ද කියලා?

**දෙමළ, ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව.**

ඇයි ටීචර්, **ඉතිහාසය?**

බොහොම හොඳයි.

වෙන මොනවා ද ඉගෙන ගන්නා විෂයන්?

**ශාරීරික අධ්‍යාපනය, සෞඛ්‍යය, දෙවන බස සිංහල,**

**ආගම, භූගෝලය, ප්‍රායෝගික තාක්ෂණ කුසලතා,**

**නාට්‍ය හා රංග කලාව, සාහිත්‍ය හා රසාස්වාදය**

හොඳයි.

දිල්ශාන් කියන්න බ්‍රහස්පතින්ද හය වැනි කාලච්ඡේදයේ තියෙන්නේ මොනවා ද?

**චිත්‍ර.**

දිල්ශාන්ට හැමෝ ම අත්පොඩියක් ගහන්න

තව විෂයයන් දෙකක් ඉතුරු වෙලා තියෙනවා නේද?

**ටීචර්, නැටුම්, සංගීතය.**

බොහොම හොඳයි.

හැමෝම හොඳට උත්තර දුන්නා.

මට හරි ම සතුටු යි.

දැන් අපි හැම දෙනා ම එකතු වෙලා

මේ **කාලසටහන** පුරවමු.

## වචන මාලාව

කාලසටහන - நேர அட்டவணை

සඳුදා - திங்கள்

අඟහරුවාදා - செவ்வாய்

බදාදා - புதன்

බ්‍රහස්පතින්දා - வியாழன்

සිකුරාදා - வெள்ளி

සෙනසුරාදා - சனிக்கிழமை

ඉරිදා - ஞாயிறு

විවේක කාලය - இடைவேளை

වේලාව - நேரம்

දෙමළ - தமிழ்

ඉංග්‍රීසි - ஆங்கிலம்

ගණිතය - கணிதம்

විද්‍යාව - விஞ்ஞானம்

ඉතිහාසය - வரலாறு

| | |
|---|---|
| සෞඛ්‍ය ශාරීරික අධ්‍යාපනය | - உடற்கல்வி |
| දෙවන බස සිංහල | - இரண்டாம் மொழி சிங்களம் |
| ආගම | - சமயம் |
| භූගෝලය | - புவியியல் |
| ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | - செயன்முறை தொழினுட்பம் |
| සාහිත්‍යය හා රසාස්වාදය | - இலக்கிய நயம் |
| නාට්‍ය හා රංග කලාව | - நாடகமும் அரங்கியலும் |
| චිත්‍ර | - சித்திரம் |
| නැටුම් | - நடனம் |
| සංගීතය | - சங்கீதம் |

## ක්‍රියාකාරකම 01

**පිළිවෙළින් ගළපමු. කියමු. ලියමු.**
ஒழுங்குபடுத்துவோம், கூறுவோம், எழுதுவோம்.

බදාදා ........................................... 1
සිකුරාදා ........................................... 2
ඉරිදා ........................................... 3
සඳුදා ........................................... 4
බ්‍රහස්පතින්දා ........................................... 5
සෙනසුරාදා ........................................... 6
අඟහරුවාදා ........................................... 7



## ක්‍රියාකාරකම 02

**පිළිතුරු කියමු. ලියමු.**
விடை கூறுவோம், எழுதுவோம்.

1. ගුරුතුමී පෙන්නුවේ කුමක් ද? ......................................
2. දවසකට කාලච්ඡේද කීයක් තියෙනවා ද? ..................
3. විවේක කාලය දෙන්නේ කීයට ද? ................................
4. නිවාඩු දවස් දෙක මොනවා ද? ......................................
5. ඔබ කැමැති ම විෂය කුමක් ද? ..........................................

## ක්‍රියාකාරකම 03

**සටහන බලා හිස්තැන් පුරවන්න.**
**குறிப்பைப் பார்த்து இடைவெளி நிரப்புவோம்.**




1. අමාලි කැමැති විෂයන් මොනවා ද? ..............................
2. දේවිකා කැමැති විෂයන් මොනවා ද? ..........................
3. ඉතිහාසය හා නැටුම්වලට කැමැති කවුරු ද? ................
4. දෙදෙනා ම කැමැති විෂයන් මොනවා ද? ...................
5. අමාලි කැමැති, එහෙත් දේවිකා අකැමැති විෂයයන් මොනවා ද? ....................................................................

## ක්‍රියාකාරකම 04

**පන්තියේ ඇති කාලසටහන බලා පිළිතුරු කියමු. ලියමු.**

**வகுப்பறையில் உள்ள நேர அட்டவணையைப் பார்த்து விடைக் கூறுவோம், எழுதுவோம்.**

1. සඳුදා පළමුවැනි කාලච්ඡේදයේ ..................... තියෙනවා.
2. අඟහරුවාදා දෙවැනි කාලච්ඡේදයේ ............. තියෙනවා.
3. බදාදා හතරවැනි කාලච්ඡේදයේ .................... තියෙනවා.
4. බ්‍රහස්පතින්දා තුන්වැනි කාලච්ඡේදයේ .......... තියෙනවා.
5. සිකුරාදා අටවැනි කාලච්ඡේදයේ .................... තියෙනවා.

## ක්‍රියාකාරකම 05

**සතියේ පාසල් එන දවස් ලියන්න.**

*கிழமையில் பாடசாலை செல்லும் நாட்களை எழுதுங்கள்.*

____________________________

____________________________

____________________________

____________________________

____________________________